# ලංසු ආරාධනය

**2026/2027 වර්ෂය සඳහා පළාත් ආයුර්වේද රෝහලේ ආපන ශාලාව පවත්වා ගෙන යාම.**

01. පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් අනුරාධපුර පලාත් ආයුර්වේද රෝහලේ **2026/2027 වර්ෂ සඳහා ආපන ශාලාව පවත්වාගෙන යාමට** මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ. මෙහි මාසික අවම ලංසු වටිනාකම **රු. 15,500.00** ක් වන අතර ගිවිසුම් කාලය ලිත් මාස 12ක් වේ.

02. ලංසු කැඳවීම වෙළෙඳපොළ මිල සැඳැහුම් ක්‍රමයට සිදුකරනු ලැබේ.

03. ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවන් හට දේශීය ආහාර වර්ග , ස්වාභාවික පළතුරු ආශ්‍රිත පාන වර්ග නිෂ්පාදනය හා ඔසු වර්ග අඩංගු ආහාර පාන සැකසීම පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

04. එසේ සුදුසුකම් තිබේනම් ඒ පිළිබද සහතික ලංසුපත් සමග අමුණා තිබිය යුතුය.

**05. සියළුම ආහාරපාන වර්ග සඳහා මිලගණන් ඉදිරිපත් කළ යුතු අතර එසේ නොකිරීමද ලංසුපත් ප්‍රතික්ෂේප වීමට හේතුවේ.**

06. සම්පූර්ණ ලංසු ලියවිලි අනුරාධපුර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙතින් **2026.03.11** වන දින සිට **2026.03.24** වන දින දක්වා සතියේ වැඩකරන දින වල **පෙ.ව.9.00 - ප.ව 3.00** අතර කාලයේ ආපසු නොගෙවන රු. **1,000.00** ක මුදලක් ගෙවා ලබාගත හැක.

07. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පත් **2026.03.25** දින ප.ව. 2.**00** ට පෙර "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, ධර්මපාල මාවත, අනුරාධපුර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කළ හැක. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කිරීම ආරම්භ කරන බැවින් ඒ සඳහා ලංසු කරුට හෝ නියෝජිතයකුට සහභාගිවිය හැක.

08. ලංසුව සමඟ පළාත් ආයුර්වේද කොමසාරිස්, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව,උතුරු මැද පළාත වෙත රු.20,000.00 ක් මුදලින් ගෙවා ලබාගත් මුල් රිසිට්පත හෝ රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් කොන්දේසි විරහිතව ලබාගත් රු.20,000.00 ක් වටිනා 2026.03.25 සිට දින 77 (2026.06.09) දක්වා වලංගු බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

09. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන අවසන් තීරණය පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

සභාපති.
ප්‍රසම්පාදන මණ්ඩලය,
පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව,
ධර්මපාල මාවත,
අනුරාධපුර.
2026.03.10